ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව -2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 288 **-** මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මිනින්දෝරු දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වියදම් වැඩසටහන්ගත කිරීමේදී, අනුමත කරනු ලබන අරමුදල් මුදල් වර්ෂය තුළ සාක්ෂාත් කරගත හැකි වැඩසටහන්වලට සීමා කරන බවට සහතික වීම ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීම වුවත් 2024 වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු වැය විෂය අංක 288-2-2-2509 යටතේ වූ රු.194,800,000 ක ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබූ අතර පුනරාවර්තන වැය විෂයයන් 6 කට අදාළව වෙන්කරන ලද ශුද්ධ ප්‍රතිපාදනයන්ගේ එකතුව රු. 16,674,273 ක් ඉතිරි වී පැවතිණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 60 ත් සියයට 99 ත් අතර පරාසයක පැවැතුණි. අවශ්‍යතාවය ඇගයීමකින් තොරව ප්‍රතිපාදන වෙන් කර ගැනීම නිසා වෙනත් ඵලදායී කාර්යයක් වෙනුවෙන් මෙම මුදල වෙන් කර ගැනීමට තිබූ අවස්ථාව අහිමිව තිබුණි.	2024 වාර්ෂික ඇස්තමේන්තු මඟින් වැය විෂය 288-2-2509 යටතේ රු.194,800,000 ක ප්‍රතිපාදන සමෝධානික ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා සලසා ගෙන තිබුණද විදේශ ණය අරමුදල් අනුමත නොවීම හේතුවෙන් එම ප්‍රතිපාදන වියදම් කිරීමට නොහැකි විය.පුනරාවර්තන වැය විෂයන් 06 හි ඉතිරිවීම් ලෙස විදෙස් සංචාර හා අධ්‍යයනයන් නතර කිරීම, මහා පරිමාණ නඩත්තු කටයුතු නිසා සුළු වියදම් අවශ්‍යතා ඇති නොවීම,භාෂා ප්‍රවීණතාවය ලැබිය යුතු නිලධාරීන් ස්ථාන මාරු වී යාම,ACRS වැඩසටහනෙහි සත්කාරකත්වය දැරීම නිසා ඒ වෙනුවෙන් දායක මුදල් ගෙවීම අවශ්‍ය නොවීම, අපේක්ෂා කළ පරිදි යන්ත්‍ර අලුත්වැඩියා අවශ්‍යතාවන් ඇති නොවීම හා පිරිසිදු කිරීමේ කටයුතු දෙපාර්තමේන්තු සේවකයින් යොදවා ඉටු කරවා ගැනීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	වර්ෂය තුළ සාක්ෂාත් කරගත හැකි වැඩසටහන් වලට සීමා කර ප්‍රතිපාදනයන් ඉල්ලුම් කළ යුතුය.

3.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත් විගණන විමසුම් 12 කට පිළිතුරු ලබා දී නොතිබුණි.	2024 වර්ෂය සඳහා විගණන විමසුම් 28 ලැබී මේ වන විට සියලු විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත. දෙපාර්තමේන්තුවේ පවතින ආයතනික ව්‍යුහය අනුව ප්‍රධාන කාර්යාලය වෙත ලිපියක් ලැබීමට නම්, ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාලය, පළාත් කාර්යාලය හරහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු විය යුතුය.විගණන විමසුමක් සඳහා පිළිතුරු කැඳවීමේ දී, ප්‍රධාන කාර්යාලයෙන් පළාත් කාර්යාලයටත්, පළාත් කාර්යාලයෙන් දිස්ත්‍රික් කාර්යාලයටත්, දිස්ත්‍රික් කාර්යාලයෙන් ප්‍රාදේශීය කාර්යාලයටත්	නියමිත කාලය තුළ විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමට හැකිවන පරිදි සුදුසු අභ්‍යන්තර වැඩපිළිවෙලක් හඳුන්වා දිය යුතුය.

ලෙස, යොමුවිය යුතු අතර, නැවත පිළිතුරු ලබා ගැනීමේදී ඒ ආකාරයටම පිළිතුර ලබාගත යුතුය. මෙම හේතුව නිසා විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාද වී ඇත.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය (i) මු.රෙ. 104(3) හා මු. රෙ. 104(4)		පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම එවිය යුතු බවට සඳහන් වුවත් එම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථා 03 කදී දින 77 ත් 55 ත් අතර කාල පරාසයක් ගතවී තිබුණි. පරීක්ෂණයෙන් පසු, අලාභහානිය සිදු වූ (නැතහොත් ඒ බව දැනගන්නට ලැබුණු) දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු බවට දක්වා තිබුණ ද එම වාර්තාව ඉදිරිපත් කිරීමට අවස්ථා 03 කදී දින 158 ත් 87ත් අතර කාල පරාසයක් ගතවී තිබුණි.	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හැරුණු කොට පළාත් 9,දිස්ත්‍රික් 25 හා ප්‍රාදේශීය කාර්යාල 89 වශයෙන්ද ඊට අමතරව දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය වශයෙන්ද සංවිධාන ගතව පවතී.ඒ අනුව ක්ෂේත්‍රය පුරා විහිදුනු රාජකාරි කටයුතු ආවරණය කරමින් ක්ෂේත්‍ර ගත රාජකාරින් ඉටු කරනු ලබයි.මෙහිදී බොහෝ අවස්ථාවලදී නොයෙක් කරුණු කාරණා හේතු කොටගෙන, වාහනවලට අනතුරු සිදුවන අවස්ථාවලට මුහුණදීමට සිදුවේ. එසේ දෙපාර්තමේන්තුවෙහි වාහනයක් අනතුරට පත් වූ විට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාර්යයන් ප්‍රධාන කාර්යාලය හරහා සිදු කිරීමේදී කාල ප්‍රමාදයන් සිදුවන බවත් ඒවා අවම කිරීමට සියළුක්‍රියාමාර්ගයන් ගනිමින් පවතී	මුදල් රෙගුලාසි වලට අනුව අදාල වාර්තා ලබාදිය හැකිවන පරිදි සුදුසු අභ්‍යන්තර වැඩපිළිවෙලක් හඳුන්වා දිය යුතුය.
	(ii) මු.රෙ. 395 (ඌ)		බැංකු සැසඳුම් පිළියෙල කළ යුත්තේ එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක්පත් ලිවීම හෝ මුදල් පොත පවත්වා ගැනීම ගැන කිසිම සම්බන්ධයක් නැති නිලධාරියකු විසින් වුවද කුරුණෑගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ මුදල් පොත පවත්වාගෙන යාම, සිගාස් වැඩසටහන පවත්වාගෙන යාම, සියලුම	දැනට දෛනිකව ලැබෙන මුදල් බැංකු ගත කරනු ලබන්නේ කාර්මික හා පරිපාලන නිලධාරි විසින්ය.විගණන විමසුම මගින් පෙන්වා දී ඇති පරිදි මින් ඉදිරියට බැංකු සැසඳුම් පිළියෙල කිරීම වෙනත් නිලධාරිනියක වෙත පැවරීමට කටයුතු කර ඇත. මෙම කාර්යාලය යටතේ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 05 ක් පවත්වාගෙන යනු ලබන අතර රාජකාරි අධික විශාල දිස්ත්‍රික්කයක් බැවින් දැනට සිටින සියලු නිලධාරින් වෙත විශාල වැඩ ප්‍රමාණයක් ඉටු කිරීමට පවරා ඇත.විගණන විමසුමේ අනුමත	මුදල් රෙගුලාසි වලට අනුව සුදුසු අභ්‍යන්තර පාලන වැඩ බෙදීමක් කළ යුතුය.

			වෙක්පත් ලිවීම හා තැපැල් කිරීම, සියලුම ගෙවීම්වලට අදාළ ලේඛන පවත්වාගෙන යාම, ආදායම් ඇස්තමේන්තු සැකසීම හා බැංකු සැසඳුම් සකස් කිරීම එක් සංවර්ධන නිලධාරිනියක් මඟින් සිදු කරන බව නිරීක්ෂණය වූ අතර අනුමත තනතුරු ප්‍රමාණයට අතිරික්තව එම තනතුර දරන නිලධාරීන් 04 දෙනෙකු සේවය කරන බව නිරීක්ෂණය විය.	සංවර්ධන නිලධාරින් ප්‍රමාණයට වඩා අතිරික්ත නිලධාරින් 04 දෙනෙකු සේවය කරන බව දන්වා ඇතත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 කින් සමන්විත බැවින් ඊට අදාළ ඉඩම් සම්බන්ධව ලිපි ලේඛන කටයුතු සිදුකිරීම සඳහා අනුමත සංඛ්‍යාව ප්‍රමානවත් නොවන බව නිරීක්ෂනය වන බැවින්, ඉදිරියේදී කාර්යාලවල කාර්යයන් සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල නැවත සමාලෝචනය කිරීමට කටයුතු කරනු ලැබේ.	
(ආ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2009 අප්‍රේල් 06 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 06 වන ඡේදය		අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාම වෙනුවෙන් පැමිණීමේ හා පිටවීමේ ලේඛණයක් පවත්වාගෙන සියලු පැමිණීම හා පිටවීම් සටහන් කළ යුතු වුවත් බිබිල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ මැනුම් ක්ෂේත්‍ර සහයකයින් නොවන අනෙකුත් නිලධාරීන් එම නාම ලේඛණයෙහි පේලි හිස්ව තබා අවිධිමත් අකාරයෙන් අත්සන් යොදා තිබුණි.	මෙම කරුණු ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පරික්ෂා කළ අතර, මින් ඉදිරියට එවන් ක්‍රියාවන් සිදු නොවන සේ කටයුතු කිරීමට වගබලා ගන්නා ලෙසට මිනින්දෝරු අධිකාරී වෙත තරයේ අවවාද කරන ලදි.	චක්‍රලේඛ විධිවිධාන අනුව පැමිණීමේ ලේඛණ නිවැරදිව නඩත්තු කළ යුතුය
(ඇ)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය මගින් සංශෝධිත මු.රෙ. 113 (6) (ආ) සහ එහි දැක්වෙන මාර්ගෝපදේශය	387,217	ලබාගත් ණය මුදල ගෙවා අවසන්විමට පෙර සේවය අතහැරයාම සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය මැතිවරණ දෙපාර්තමේන්තුව,ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා පදිංචිය සහ ඔවුන්ගේ වත්කම් පිළිබඳ තහවුරුවක් ලබාගෙන නීතිපති මඟින් ණය මුදල් අයකරගැනිමට කටයුතු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගොස් ඇති නිලධාරින් 04	වැඩ තහනම් කර ඇති සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ ඔබ විසින් දක්වා ඇති පරිදි චක්‍රලේඛ ප්‍රකාරව අදාල ණය ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	චක්‍රලේඛ විධිවිධාන අනුව ණය ශේෂ අයකර ගතයුතුය.

		දෙනෙකුගෙන් අයවිය යුතු රු.387,217 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර ඉන් රු.327,216 ක් වර්ෂ 5-10 ත් අතර කාල පරාසයකට අයත් ඒවා විය.		
(ඇ)	මිනින්දෝරු දෙපාර්තමේන්තු වේ සර්වේයර් ජනරාල් විසින් 2024 අගෝස්තු 21 දින නිකුත් කරන ලද අංක 06/2024 දරන දෙපාර්තමේන්තු කළමනාකරණ චක්‍රලේඛයේ 1.2 ඡේදය	ශ්‍රී ලංකා මැනුම් ක්ෂේත්‍ර සහායක සේවයේ (මැනුම් ඕවර්සියර්වරුන් ඇතුලුව) ස්ථාන මාරුවීම් - 2025 සම්බන්ධයෙන් එකම සේවා ස්ථානයේ වසර 05 කට අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයන් අනිවාර්යෙන්ම ස්ථාන මාරුවීම් වලට යටත් වන බව දක්වා තිබුණද බද්දේගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ශ්‍රී ලංකා මැනුම් ක්ෂේත්‍ර සහයක සේවයේ එක් අයෙකු අවුරුදු 10 ක කාලයක් එම කාර්යාලයේද,ඇල්පිටිය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ නිලධාරීන් 05 දෙනෙකු අවුරුදු 05 ත් 07 ත් අතර කාලයක් හා එක් අයෙකු අවුරුදු 30 ක කාලයක් එම ප්‍රාදේශීය කාර්යාලයේ ද, උඩුගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ නිලධාරීන් 08 දෙනෙකු අවුරුදු 05 ත් 09 ත් අතර කාලයක් එම කාර්යාලයේම සේවය කර තිබුණි.	කේ.සී.එස්. කුමාර- මුර රාජකාරි පුරප්පාඩු වීම. බී.වී.ජේ.ටී.පියුමාල්- ශ්‍රී ලංකා මැනුම් සහයකවරුන්ගේ සංගමයේ දිස්ත්‍රික් නියෝජිත ලෙස කටයුතු කිරීම සහ මවගේ අසනීප තත්වය. කේ.එම්.ජී.තිලකරත්න-2001 සිට 2016 දක්වා පුහුණු මැනුම් සහයකවරුන්ගේ සංගමයේ දිස්ත්‍රික් නියෝජිත ලෙස කටයුතු කර ඇත. A.M.අනිල්-2023 අප්‍රේල් මස සිට මැනුම් ඕවර්සියර් ලෙස උසස් වීම ලබා ඇත.2025 නොවැම්බර් විශ්‍රාම යාමට නියමිතයි.	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය

3.4 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගාල්ල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ කෑම කාමරය අළුත්වැඩියාවේදී පොළව ටයිටේනියම් කිරීම සඳහා වැය විෂය 12 යටතේ වර්ග මීටර් 49.06 සඳහා වර්ග මීටරයකට රු.5,600 බැගින් රු.274,716 ක් ගෙවීම්	කෑම කාමරයේ අලුත්වැඩියාවේදී පොලව ටයිටේනියම් කිරීම නියමිත ප්‍රමිතියට අනුව සිදුකර නොතිබූ බැවින් තාක්ෂණික නිලධාරීන් විසින් පරික්ෂා කර බලා නැවත ටයිටේනියම් කරන අතර එය 2025.02.10 දින නිම කරන ලදී.ප්‍රමාණ පත්‍රයට ඇනුව සිවිලිම් ෆෑන් 05 ක් ඇස්තමේන්තු ගත කර තිබූ අතර අදාල වැඩ කටයුත්ත	ප්‍රමාණ පත්‍රයෙහි ඇති වැඩ විෂයන් වෙනස් කිරීමකදී විධිමත් ලෙස අනුමැතිය ලබාගත යුතුය.

කර තිබුණද අදාල වැඩ විෂයේ ඇතුළත් අගල් ½ ගණකමට සිදුකර නොතිබුණි.එසේම සිවිලින් පැන් 05 ක් සඳහා එකක් රු.30,000 බැගින් රු.150,000 ක් ගෙවීම් කිරීමට චෙක්පත් ලියා තිබුණද සවිකර තිබුණේ බිත්ති විදුලි පංකා 04 ක් බවත් 2025 ජනවාරි 30 දින භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.	කරගෙන යන අතර තුර එම ස්ථානයට වඩාත් උචිත වනුයේ බිත්ති විදුලි පංකා බැවින් එම වැඩ විෂය අතිරේක වැඩ යටතේ බිත්ති විදුලි පංකා 04 ක් පමණක් මිලදීගත් අතර ඒ සඳහා වැයකර ඇත්තේ බිල්පතට අනුව 99,824 කි. එය තාක්ෂණ නිලධාරී විසින් අනුමත කර ඇති බැවින් බිල්පතට අනුව ගෙවීම් කරන ලදී. මේ ආකාරයේ ප්‍රමාණ පත්‍රයෙහි ඇති වැඩ විෂයන් වෙනස් කිරීමකදී විධිමත් ලෙස අනුමැතිය ලබා ගෙන ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	“ඉඩම් තොරතුරු සැපයීමේ සදා ප්‍රමුඛයා” වන දැක්ම පෙරදැරි කරගෙන “ වෘත්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි පිරිසක් මගින් ගුණාත්මක භූමි තොරතුරු නිපයුම් හා සේවාවන් සැපයීම” මෙහෙවර කරගත්,දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් මායිමගල් දමා ඉඩම් කට්ටි මැනීම, විවිධ මැනුම්, අත්කර ගැනීමේ මැනුම්, ඉංජිනේරු මැනුම්, සිතියම්කරණ සහ පාලන මැනුම්, උසාවි අධිකාරී පත්‍ර මැනුම්, කැඩැස්තර මැනුම් සහ භූමිතික මැනුම් යන මැනුම් වර්ග 08 යටතේ පවතින උප මැනුම් වර්ග සඳහා 2007 මැයි 12 දිනැති අංක 2007/06 දරන චක්‍රලේඛය මගින් 2007 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මිනින්දෝරුවරයකුගේ මාසික වැඩ ප්‍රමාණය (Norms) තීරණය කර තිබුණි. වර්ෂ 17 කටත් පෙර පිහිටුවා ගත් මෙම මාසික වැඩ ප්‍රමාණය 2024 වර්ෂය වන තෙක් නොවෙනස්ව පවතී. 2021 පෙබරවාරි 25 දිනැති ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ 02/2021 මගින් 2021 මාර්තු 01 දින සිට මෙම මාසික වැඩ ප්‍රමාණය සංශෝධනය කිරීමට කටයුතු කළද, 2021 මාර්තු 17 දිනැති අංක 2/3/03/06 දරන ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මගින් දන්වා තිබුණේ රජයේ මිනින්දෝරුවරු වෘත්තීය ක්‍රියාමාර්ගවලට එළඹෙන බව දන්වා සිටින බැවින් ඉහත චක්‍රලේඛය නැවත දැනුම්දෙන තුරු අත්හිටුවන ලෙසටයි. ඉහත ලිපිය මත පදනම්ව 2021 මාර්තු 19 දිනැති ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ 02/2021 (i) මගින් 02/2021 චක්‍රලේඛය නැවත දැනුම් දෙනතුරු අත්හිටුවා තිබුණි.2024 වර්ෂයේ මැනුම් කටයුතු සිදු කිරීම සඳහා රු25,549,800 ක් වටිනා ඩ්‍රෝන යාත්‍රා 2 ක් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අතර 2018 සිට 2021 වර්ෂය දක්වා නවීන මැනුම් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු.මිලියන 207 මුදලක් ද වැයකර තිබුණි. එලෙස තාක්ෂණික උපකරණ හා මැනුම් ශිල්පක්‍රම භාවිතයත් සමඟ දෙපාර්තමේන්තුවේ දැක්ම සහ	මාසික වැඩ ප්‍රමාණයන් සමාලෝචනය කර සංශෝධනයෙන් පසු වාර්තාව ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත භාර දී ඇත.ලේකම්වරයාගේ අනුමැතිය ලද පසු අදාල මාසික වැඩ ප්‍රමාණයන් සංශෝධනය කිරීමට ක්‍රියා කරනු ඇත. නවීන උපකරණ මිලදී ගැනීම ලංකාවේ ප්‍රමුඛ තාක්ෂණික දෙපාර්තමේනක්තුවක් ලෙස ලෝකයේ අනෙකුත් රටවල් සමග සාමකාමීව කටයුතු කිරීමේදී අත්‍යාවශ්‍ය කරුණක් වන අතර තාක්ෂණික ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සහ ඉඩම් මිල ඉහළ යන බැවින් නිරවද්‍යතාව මැනීම සඳහා අත්‍යාවශ්‍ය කරුණක් වන අතර මාසික ඉලක්කයන් ඉහළ නැංවීමේදී මීට අමතරව වර්තමානයේ පවතින ඉඩම් ගැටලු විසඳාගෙන ප්‍රගතිය ලබා ගැනීමට සිදුවී ඇති බැවින් එවැනි කරුණු බාධාවක් වන බව වැඩිදුරටත් දන්වමි.	සම්මතයන් (Norms), මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර ක්‍රියාත්මක කල යුතුය.

මෙහෙවර ඉටුකර ගැනීම සඳහා මිනින්දෝරුවරයකුගේ මාසික වැඩ ප්‍රමාණය වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය නොකර පෙර පිහිටුවා ගත් සම්මතයම තවදුරටත් ඉටුකරමින් සිටින බව නිරීක්ෂණය විය.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

(අ) විගණන නිරීක්ෂණය

2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මැනුම් වර්ග 09 ක් යටතේ ලැබී ඇති මුලු මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව 139,668 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම කළ සංඛ්‍යාව 106,173 ක් විය. ඒ අනුව එදිනට නිම නොකළ සංඛ්‍යාව 33,495 ක් හෙවත් සියයට 24ක් විය. එම සම්පූර්ණ නොකළ මැනුම් ඉල්ලීම් පිළිබඳ කාල ප්‍රමාදයන් පහත පරිදි විය.

මැනුම් ඉල්ලීම් ලැබුණු වර්ෂය	නිම නොකළ මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව	ප්‍රමාද කාලය වර්ෂ
2020 හා ඊට පෙර	9,708	04 ට වැඩි
2021	4,133	03 ට වැඩි
2022	4,995	02 ට වැඩි
2023	6,132	01 ට වැඩි
2024	8,527	01 ට අඩු
එකතුව	33,495	

ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම

රජයේ පසුගිය වසරවල පැවති ප්‍රතිපත්තිමය තීරණ මත රාජ්‍ය සේවය සඳහා බඳවා ගැනීම අත්හිටුවා තිබීම.රජයේ මිනින්දෝරුවරුන් 850 ක් සිටිය යුතු වුවත්, දැනට එම සංඛ්‍යාව 550 කට ආසන්න ප්‍රමාණයක් වේ.එසේම වාර්ෂිකව ඉටුකල නොහැකි ප්‍රමානයට වඩා මැනුම් ඉල්ලීම් ප්‍රමාණයක් ලැබීමත් දෙපාර්තමේන්තුව සතුව ඇති වාහන බොහොමයක් අවුරුදු 20 ට වඩා පැරණි ඒවා බැවින්, නිතර අළුත්වැඩියාවන් සිදු කිරීමට සිදුවන බැවින්, ක්ෂේත්‍ර කටයුතු සඳහා බාධා ඇතිවීම රජයේ හදිසි අත්කර ගැනීම් හා සංවර්ධන වැඩවලට අදාළ මැනුම් සඳහා ප්‍රමුඛතාවයක් දීමට සිදුවේ. උසාවි කමිෂන් පත්‍රවල කටයුතු කිරීමට යෑමේදී ඒවායේ සඳහන් ලේඛන ලබාදීම ප්‍රමාදවීම ආදී කරුණු මත මැනුම් වැඩ ප්‍රමාදවීම හා ඒ අනුව මැනුම් ඉල්ලීම් එකතුවීම සිදුවේ.

නිර්දේශය

මැනුම් ඉල්ලීම් ඉටුකිරීමේ කාර්යක්ෂමතාවය වැඩි කළ යුතුය.

(ආ) විගණන නිරීක්ෂණය

කුරුණෑගල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට ලැබූ මැනුම් ඉල්ලීම් 58 ක් වෙනුවෙන් මුලු මැනුම් ගාස්තු ලෙස 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුල රු.5,317,151 ක මුදලක් අයකර ගෙන ඇතත් මෙම මැනුම් ඉල්ලීම සඳහා විගණිත දිනය වූ 2024 ඔක්තෝබර් 28 වන විට දින 334 සිට දින 3,397 දක්වා වූ කාල පරාසයක කාල පමාවක් සිදුව ඇතත් අදාළ මැනුම් කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. මෙම මැනුම් ඉල්ලීම් මායිම් ගල් මැනුම් 33 කින්ද, විවිධ මැනුම් 03 කින්ද,අත්කර ගැනීමේ මැනුම් 04 කින් හා උසාවි කොමිෂන් මැනුම් 18 කින්ද සමන්විතව ඇති බව SRIMS පද්ධතිය පරික්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම

ඉහත පිලිතුරම අදාළ වේ.

නිර්දේශය

ලැබෙන මැනුම් ඉල්ලීම් කඩිනමින් ඉටුකළ යුතුය.

4.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වසරේ රජයේ ප්‍රමුඛ කාර්යයක් ලෙස දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා ඉඩම් තොරතුරු සේවා පද්ධති ව්‍යාපෘතිය කිසිදු ප්‍රගතියක් ලබා කරගෙන නොතිබූ අතර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදාමයෙහි ප්‍රතිඵලය ලෙස මෙම ව්‍යාපෘතියට අදාලව මූලික කාර්යයන් කිසිවක් සිදු නොකර 2022, 2023 හා 2024 යන වර්ෂ වලදී අයවැය තුළින් ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි.	2022 වසරේ මුල සිටම ආරම්භ කිරීමට මෙම දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය සූදානම්ව සිටියද විදේශ ණය අරමුදල් අනුමත නොවීම මත එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම නැවතී ඇත. එහෙත් දේශිය අරමුදල් භාවිතා කරමින් කාර්යාල පරිශ්‍රය සකසා අවසන් කර ඇත.එම ව්‍යාපෘතිය සඳහා ඉදිරියේදී විදේශ ණය අපේක්ෂාවෙන් සිටින අතර, විදේශ ණය ලැබීමෙන් අනතුරුව අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත.	අපේක්ෂිත කාර්යය ඉටු නොකරන විට ප්‍රතිපාදන වෙන්කර නොගත යුතුයි.
(ආ)	දෙපාර්තමේන්තුවේ මැනුම් කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා භාවිතා කළහැකි අඛන්ඩව ක්‍රියාකරන භූමිතික මැනුම් පාලන පද්ධතිය (SLCORS net) බස්නාහිර පලාත ආවරණය වන පරිදි ස්ථාන 06 ක පමණක් 2024 වර්ෂය අවසන් වන විට ස්ථාපිත කර තිබූ අතර මුලු දිවයිනම ආවරණය වන පරිදි ස්ථාපිත කළයුතු ඉතිරි පද්ධති 34 ස්ථාපිත කර නොතිබුණි.	2024 වසරේ මූල්‍ය ප්‍රතිපාදන නොමැති නිසා මෙම කාර්යය සිදු නොකරන අතර, මෙම වසරේදී මුළු දිවයිනම ආවරණය වන පරිදි පාලන ලක්ෂ 34ක් ස්ථාපනය කිරීම සඳහා රු.මිලියන 170 ක් බිම්සවිය අරමුදල් මගින් වෙන් කර මූලික වැඩකටයුතු ආරම්භ කර ඇත.	මැනුම් කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා කළයුතු කාර්යයන් නොපමාව ඉටුකළ යුතුය.
(ඇ)	වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය යටතේ 2024 දෙසැම්බර් 31 වන විටත් වැඩ අවසන් නොකල මැනුම් 65ක් පවතින බව නිරීක්ෂණය විය. 2024 වර්ෂය තුළ ව්‍යාපෘති අවසන් වන බැවින් ව්‍යාපෘති කාලය තුළ අදාළ මැනුම් කාර්යයන් අවසන් කිරීම පිළිබඳ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අනුරාධපුර කාර්යාලය කටයුතු කර නොතිබුණි.අදාළ මැනුම් කටයුතු භාර දුන් මිනින්දෝරුවන්ගේ කාර්යසාධන ඇගයීමේ දී නියමිත කාලය තුළ වැඩ අවසන් නොවූ මිනුම් කටයුතු ඇගයීමට ලක් කර නොමැති බව නිරීක්ෂණය විය.	වැව්ගම් පුබුදුව මැනුම් බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරනු ලබන අතර , ඔවුන්ගේ ප්‍රගතිය මාස් පතා Google පත්‍රයක යාවත්කාලීන කරනු ලබයි. වැව්ගම් පුබුදුව වැඩමුලු පැවැත්වීමේදී මැනුම් කටයුතු හැකි පමණ ඉක්මනින් නිම කිරීමට උපදෙස් ලබා දී ඇත.	නියමිත කාලය තුල ව්‍යාපෘති කාර්යයන් ඉටු කළ යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර එහි 4.2.1 (ආ) ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් 2024 වර්ෂය සඳහා එවැනි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	2025 වර්ෂයේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන ලදී.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරීන් විසින් ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව,විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු බව දක්වා තිබුණද 2024 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මෙහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකර නොතිබුණි.	2025 වර්ෂයේ මුල් මාස 04 සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීයාගේ අනුමැතිය ලබා ගෙන ඇති අතර, 2025 වර්ෂය සඳහා සකස් කල ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති අතර, අනුමැතිය ලැබීමෙන් අනතුරුව එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව,විගණකාධිපති හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව නියමිත දිනයන් තුල ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කරගත යුතුය.
(ඇ)	කුලියාපිටිය කනදුල්ල ප්‍රදේශයේ පිහිටි ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ අංක 48 දරන පෙරසව් කඳවුරේ අලුත්වැඩියාව සඳහා 2022 වර්ෂයේ සිට ඇස්තමේන්තු පිළියෙල කර ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි.ප්‍රතිපාදන සීමිත වීම හේතුවෙන් මෙම ප්‍රසම්පාදනය අත්තිවාරම හා බිත්ති බැඳීම, බිත්ති කපරාරුව හා ජනෙල් උළුවහු තබා වැඩ නිම කිරීම ලෙස අදියර 02 කින් රු. 2,908,167 කට නිම කිරීමට සැලසුම් කර පසුව තවත් අදියර 2 ක් යටතේ ඇස්තමේන්තු 02 ක් එකතු කිරීම මත ඇස්තමේන්තු වියදම රු.8,335,871 දක්වා වැඩි වී තිබුණි. නිකවැරටියේ පිහිටි ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය 2023 වර්ෂයේ සිට එහි ස්ථාපිත කිරීමේ අරමුණින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇතත් 2024 ඔක්තෝබර් 30 දින වන විටත් එය අංගසම්පූර්ණ ලෙස නිම කර කාර්යාලය ස්ථාපිත කර නොතිබුණි.	2021/2022 වර්ෂය වල එවකට පැවති කොරෝනා වසංගතය,ඉන්ධන හා ආර්ථික අර්බුධය හමුවේ කුලියාපිටිය හා ඒ අවට ප්‍රදේශවලින් ලැබෙන අති විශාල මැනුම් ඉල්ලීම් ඉටුකිරීමේදී ඇතිවන අපහසුතා පිළිබඳ සලකා නිකවැරටිය ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන කුලියාපිටිය ප්‍රදේශයේ කාර්යාලයක් ස්ථාපිත කිරීම තුළින් බිංගිරිය,කොබෙයිගනේ,පඩුවස් නුවර (නැගෙනහිර),පඩුවස්නුවර (බටහිර),කුලියාපිටිය (නැගෙනහිර), කුලියාපිටි-ය (බටහිර) , පන්නල හා උඩුබද්දාව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මහජනතාව වෙත විසිරී යන සේවාවන් ලබා දීමට මෙම කාර්යාලයේ ඉදිකිරීම තුලින් හැකියාව ලැබී ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ විධිවිධාන වලට අදාල අනුමැතීන් මත ක්‍රියාකළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

4.5.1 වාහන පාලනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් කැඳවූ තොරතුරු අනුව දෙපාර්තමේන්තුවේ නමට වාහන 384 ක් පැවතියද දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ තොරතුරු අනුව එම ගණන 326 ක් විය. ඒ අනුව වාහන 96 ක්	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අනුව,අප දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන සංඛ්‍යාව 384 ක් බවට සඳහන් වන බැවින් පහත පරිදි අප සතුව නොපවතින වාහන පිළිබඳව උපදෙස් ලබා ගනිමින් මෙම තත්ත්වය නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවති.	වාහන පිළිබඳ තොරතුරු නිසි ලෙස යාවත්කාලීන කරගත යුතුය.

	දෙපාර්තමේන්තු වාහන ලැයිස්තුවේ ඇතුළත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඉන් වාහන 04 ක් 2006 න් පසු වාහන වන අතර ඉතිරි වාහන, 1957 ත් 1996 ත් අතර කාලයේ ලියාපදිංචි කළ වාහන විය. ඒ පිළිබඳ විධිමත් පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට දන්වා නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.	පෙන්වා දී ඇති වාහන 106 ක ලැයිස්තුවෙහි වාහන 96 ක තොරතුරු කිසිවක් සොයා ගැනීමට නොහැකිව ඇත.ඒ බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කරමි.ඔවුන්ගේ දත්ත පද්ධතියෙන් ඒවා ඉවත් කිරීමට ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳව උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. මෙම වාහන සම්බන්ධ ගොණු ඉතා පැරණි හෙයින් ලේඛනාගාරයද ඇතුලුව පරීක්ෂා කිරීමටද සිදු වූ බැවින් නිවැරදි කර ගැනීම සඳහා පමා වූ බව වැඩිදුරටත් පෙන්වා දෙමි.	

4.5.2 ඉඩම් කළමනාකරණය

(අ)	මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතුව 2023 දෙසැම්බර් 31 දිනට රු.7,579,529,500 ක් වටිනා ඉඩම් කැබලි 125 සිගාස් වැඩසටහනෙහි සඳහන්ව ඇතත් ඉන් රු.1,286,302,500 ක් වටිනා ඉඩම් කැබලි 66 කට අදාළව ඉඩම් ලබාදීමේ සහතික විගණනයට ඉදිරිපත් නොවිය.	දෙපාර්තමේන්තුවේ පවත්නා ඉඩම් තොරතුරු හා සිගාස් පද්ධතියේ පවත්නා තොරතුරු සසඳා බලා ඒ පිළිබඳව විගණනයට වාර්තා කිරීමට සටහන් කරගෙන ඇත.	සියලුම ඉඩම් සඳහා ඉඩම් ලබාදීමේ සහතික ලබාගත යුතුය.
(ආ)	දෙපාර්තමේන්තුව සතු ඉඩම් කැබලි 139 කට අදාළව පළාත් 9 යටතේ සාරාංශ 9 ක් සමග රජයේ දෙපාර්තමේන්තු වලට ඉඩම් ලබාදීම පිළිබඳ සහතික 79 ක් විගණනයට ඉදිරිපත් කර ඇතත් සිගාස් වැඩසටහනෙහි ඉඩම් කැබලි 125 ක් සඳහන්ව තිබුණි.දෙපාර්තමේන්තුව සතුව ඉඩම් පිළිබඳ යාවත්කාලීන වූ නිවැරදි ලැයිස්තුවක් සකස් කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.	ඉහත පිළිතුරම අදාළ වේ.	ඉඩම් පිළිබඳ යාවත්කාලීන වූ නිවැරදි ලැයිස්තුවක් පවත්වා ගත යුතුය.
(ඇ)	තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර එවන ලද නමුත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම්වලට ඇතුළත් කර ගන්නා ලෙසට ලිපියක් නොමැති ඉඩම් කැබලි 08 ක මුලු වටිනාකම රු.143,736,000 ක් සිගාස් වාර්තාවෙහි ඇතුළත් වී නොතිබුණි. එහෙත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම්වලට ඇතුළත් කර ගන්නා ලෙසට ලිපියක් නොමැතිව තක්සේරු දෙපාර්තමේන්තුවේ ලිපිය මත පමණක් පදනම්ව රු.202,745,000 ක් වටිනා ඉඩම් කැබලි 05 ක වටිනාකම් සිගාස් වාර්තාවෙහි ඇතුළත්ව තිබුණි. ඒ අනුව ඉඩම්වල වටිනාකම සිගාස් වාර්තාවට ඇතුළත් කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොමති බව විගණනයේදී නිරීක්ෂණය විය.	ඉහත පිළිතුරම අදාල වේ.	තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර එවන ලද වටිනාකම මත ඉඩම් වල වටිනාකම ගිණුම් වලට ගත යුතුය.

4.5.3 මැනුම් උපකරණ පාලනය

(අ)	2022 ඔක්තෝබර් 05 දින ප්‍රධාන කාර්යාලයෙන් පැලවත්ත ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය වෙත ලබාදී තිබුණු Stonex-DL 10077 දරන උපකරණය දිශාව නිවැරදිව පෙන්වීම සම්බන්ධ ගැටලු මත මෙම උපකරණය සේවා කිරීමට හා අලුත්වැඩියා කිරීමට 2024 අප්‍රේල් 30 දින ප්‍රධාන කාර්යාලය වෙත භාර දී නැවත 2024 ජුලි 17 දින ප්‍රාදේශීය කාර්යාලය වෙත රැගෙන ගොස් ඇති නමුත් අදාළ දෝෂය තවදුරටත් පැවතියද 2023 අප්‍රේල් 18 දිනෙන් පසුව විගණිත දිනය වන 2024 සැප්තැම්බර් 11 දින දක්වා භාවිතයට නොගෙන අවුරුදු 01 යි මාස 05 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.	මෙම උපකරණය සේවා සහ අලුත්වැඩියා කිරීම් කළද නිවැරදි දිශාව පෙන්වීම සම්බන්ධ ගැටලුව තවදුරටත් පවතින බැවින්,ක්ෂේත්‍ර කටයුතු සඳහා භාවිතා නොකරයි. එම දෝෂය නිවැරදි කර ගැනීම සඳහා නැවත උපකරණ හා ගොඩනැගිලි අංශය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී ඇත.	මැනුම් උපකරණවල පවත්නා දෝෂ වහා නිවැරදි කර මැනුම් කටයුතු කාර්යක්ෂම කළ යුතුය.
(ආ)	2022 නොවැම්බර් 01 දින සේවා කිරීම සඳහා DL 10115 දරන උපකරණය ප්‍රධාන කාර්යාලය වෙත භාර දී ඇති නමුත් 2025 මෙම වාර්තාවේ දිනය දක්වා සේවා කර නැවත පැලවත්ත ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය වෙත භාර දී නොතිබුණි.	මෙම උපකරණය සේවා කිරීම සඳහා 2022.11.01 දින ප්‍රධාන කාර්යාලයට භාර දී ඇත. මේ වන තෙක් එහි සේවා කටයුතු අමතර කොටස්වල හිඟතාවය මත ඉටු කිරීමට නොහැකි වී ඇත.විකල්පයක් යෙදීම හෝ භාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමට උපදෙස් දී ඇත.	මැනුම් උපකරණවල පවත්නා දෝෂ වහා නිවැරදි කර මැනුම් කටයුතු කාර්යක්ෂම කළ යුතුය.

4.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 880 පරිදි ඇප තැබීමට අවශ්‍ය නිලධාරින් ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වන අධිකාරිය වන රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. තවද 2021 දෙසැම්බර් 20 දිනැති මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල චක්‍රලේඛ අංක 01/2021 හි 05 වගන්තිය ප්‍රකාරව නිලධාරීන් අනුයුක්ත කළ දින සිට මාස දෙකක් ඇතුළත ඇප තැබීම ආරම්භ කළ යුතු බවත්, 07 වගන්තිය ප්‍රකාරව පළමු වාරිකය ලෙස රු.2,000 ක් හා ඉතිරි මුදල් වාරික 10 කින් ද තැන්පත් කිරීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණි. නමුත් නිලධාරීන් දෙදෙනකු කිසිදු ඇපයක් තබා නොතිබුණු අතර නිලධාරීන් විසි දෙනෙකු 2024 දෙසැම්බර් 31 වනවිට ප්‍රමාණවත් ඇපයක් තබා නොතිබුණි.	මේ සම්බන්ධව වර්තමාන තත්ත්වය පිළිබඳ පැහැදිලි කිරීම මෙන්ම කාර්ය මණ්ඩල චක්‍රලේඛ අංක 01/2021 හි 05 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙසට නැවත වරක් නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී.	රජයේ නිලධාරින්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතුයි.

4.7 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	SRIMS පද්ධතියේ සඳහන් තොරතුරු අනුව එම ඉල්ලීම් ප්‍රාදේශීය කාර්යාලයට නිකුත් කළ දින සිට මිනින්දෝරුවරයෙකු වෙත පැවරීම සඳහා කළුතර දිස්ත්‍රික්කයේ මැනුම් ඉල්ලීම් 96 කට අදාළව දින 2 සිට දින 1,323 දක්වාද වූ කාල පමාවක් සිදුවී තිබීම,මැනුම් ඉල්ලීම් 55 කට අදාළව මිනින්දෝරුවරයා වෙත අදාල පැවරීම කළ දිනය සඳහන්ව නොතිබුණි.එසේම කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැනුම් ඉල්ලීම් 51 කට අදාළව එම ඉල්ලීම් මිනින්දෝරුවරයෙකු වෙත පැවරීම සඳහා දින 4 සිට දින 1,914 දක්වා වූ කාල පමාවක් සිදුව තිබූ අතර ඉතිරි මැනුම් ඉල්ලීම් 33 ට අදාළව මිනින්දෝරුවරයා වෙත පැවරීම කළ දිනය සඳහන්ව නොමැති බැවින් එම ඉල්ලීම් මේ දක්වාම මිනින්දෝරුවරයෙකුට පවරා නොමැති ඉල්ලීම්ද නැතහොත් මිනින්දෝරුවරයෙකුට පැවරූ නමුත් SRIMS පද්ධතියේ තොරතුරු ඇතුළත් නොකළ ඉල්ලීම්ද යන්න විගණනයට තහවුරු කරගත නොහැකි විය.	විවිධ හේතූන් මත මැනුම් ඉල්ලීම් වැඩ ආරම්භ කිරීම සඳහා ක්ෂේත්‍රයට නිකුත් කිරීම ප්‍රමාද වේ.එනම් මැනුම් ඉල්ලීම්වල අඩුපාඩු තිබීම හා ඒවාට අදාළ ආයතනවලින් පිළිතුරු ප්‍රමාදවීම මුදල් ගෙවිය යුතු මැනුම් ඉල්ලීම් සඳහා මැනුම් ගාස්තු දැනුම් දුන්නද අදාළ ආයතනවලින් ඒවා ගෙවීම ප්‍රමාදවීම (මැනුම් ගාස්තු ගෙවන තෙක් ක්ෂේත්‍රයට නිකුත් කිරීම සිදු නොකරයි.) උසාවි මැනුම්වලදී ලේඛන ලබා නොදීම හා අවශ්‍ය උපදෙස් නිසි පරිදි ලබා නොදීම.මේ පිළිබඳව අවස්ථා කීපයකදීම ලිපි මඟින් දැනුවත් කරන ලදී.එම අඩුපාඩු සම්පූර්ණ වීමෙන් පසුව මෙම මැනුම් ඉල්ලීම් ක්ෂේත්‍රයට නිකුත් කරන බැවින් මෙලෙස විශාල කාල පරාසයක් ඇතිවීමට හේතු විය.	මැනුම් ඉල්ලීම ලැබීමෙන් පසු මිනින්දෝරුවර යෙකු වෙත පැවරිය යුතුය.
(ආ)	ලිතෝ මුද්‍රණ අංශය සහ තැටි සැකසුම් සඳහා දැනට පවතින මුද්‍රණ යන්ත්‍ර ඉතා පැරණි හා විශාල වටිනාකමකින් යුතු, විශාල කාර්යයක් ඉටුකර ගත හැකි යන්ත්‍ර වන අතර Auto print, Crabtree සහ Plate යන යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා සේවකයින් නොමැතිවීම නිසා ඌන උපයෝජිතව පවතී.Color metal යන්ත්‍ර 3 න් 2 ක් පමණක් මාරුවෙන් මාරුවට යන්ත්‍රය බැගින් ක්‍රියාත්මක කරවන බවත් අනෙක් යන්ත්‍රයේ කොටස් මෙම යන්ත්‍ර 02කට අවශ්‍ය වන අවස්ථා වලදී භාවිතයට ගන්නා අතර Flat bed litho press යන්ත්‍රය සහ German Gilatic යන්ත්‍රය ද නිෂ්කාර්යව පැවතිණි.	ප්‍රමාණවත් සේවකයින් සිටින විට මෙම උපකරණ නිවැරදිව උපයෝජණය කර ඇති අතර, විශාල වටිනාකමකින් යුතු කාර්යයන්ද නිම කිරීමට කටයුතු කර ඇත. මෙම ගැටලුව මතුව ඇත්තේ 2016 වසරේ සිට ක්‍රමක් ක්‍රමයෙන් සේවකයින් අඩුවීම සහ එයට සාපේක්ෂව නව බඳවා ගැනිම් සිදු නොවීමයි. මේ වන විට අවශ්‍ය බඳවා ගැනීම් සම්බන්ධව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කිහිප අවස්ථාවකම දැනුවත් කර ඇත.සියලුම උපකරණ එකවර ක්‍රියාත්මක කිරීමට ප්‍රමානවත් මානව සම්පතක් නොතිබුනද වරින් වර ක්‍රියාත්මක කළ හැකිවන පරිදි භාවිතා කිරීමටත් සහ අවශ්‍ය සේවාවන් නියමිත කාල වකවානු වල සිදුකර උපකරණය මනාව නඩත්තුව කිරීම සහ ආරක්ෂා කරගැනීම සිදුකර ඇත.	ප්‍රමාණවත් සේවකයින් සංඛ්‍යාවක් බඳවා ගෙන උපකරණ නිවැරදිව උපයෝජණය කළ යුතුය.
(ඇ)	මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කාර්යයක් වන සිතියම් මුද්‍රණ කටයුතු වර්ධනය කර ගැනීම වෙනුවෙන් නව තාක්ෂණයට ගැලපෙන අයුරින් නවීකරණය වෙනුවෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොමැති අතර සිතියම් සංග්‍රහයේ මුද්‍රණ කටයුතු 2020 වර්ෂයෙන් පසු 2024 නොවැම්බර් මස අවසන් වන තෙක් සිදුකර නොතිබූ අතර එමගින් දෙපාර්තමේන්තුවට ආදායමක් ලැබීම අහිමි කර තිබුණි.	මෙම පාසැල් සිතියම් සංග්‍රහය මුද්‍රණය කිරීමට වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුව අවශ්‍ය අනුමැතියන් ගෙන මූලික කටයුතු කලද කාර්ය මණ්ඩල හිඟතාවය නිසා ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇත.මේ වන විට ලිතෝ අංශයේ රාජකාරි කර විශ්‍රාම ගිය නිලධාරින් 3 දෙනෙකුගේ සේවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2018 අනුව අවශ්‍ය නිර්දේශයන් සහ අනුමැතිය ලබා ගෙන කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයට බඳවාගැනීමෙන් මෙම කාර්යය කිරීමට නියමිතය.	නව තාක්ෂණයට ගැලපෙන අයුරින් මුද්‍රණ කටයුතු සිදුකර ආදායම් වැඩිකර ගත යුතුය.

(ඈ)	බද්දේගම ප්‍රාදේශිය කාර්යාලයේ මැනුම් ක්ෂෙත්‍ර සහයකයින් එක් එක් මාසවලදී ක්ෂෙත්‍ර රාජකාරිවල යෙදුන දින ගණන් පිළිබඳව සිදුකල නියැදි පරීක්ෂාවේදී 2024 වර්ෂයේ මාස 09 ක කාලයට අදාළව ඔවුන් ක්ෂෙත්‍ර රාජකාරිවල යෙදෙන දින ගණන සියයට 18 සිට සියයට 42 දක්වා අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. තවද එක් එක් මැනුම් ක්ෂෙත්‍ර සහායක නිලධාරියා මාසයක් තුල ක්ෂෙත්‍ර රාජකාරි සඳහා නිරත වීම් පිළිබඳ 2024 වර්ෂයේ මාස 07 ක සිදුකල නියැදි පරීක්ෂාවේදී ඇතැම් නිලධාරීන් දින 01 ත් 16 ත් අතර ප්‍රමාණයක රාජකාරිවල නිරත තිබූ අතර ඇතැම් නිලධාරීන් මාසය තුළ කිසිඳු රාජකාරියක යෙදී නොතිබුණි. ඇල්පිටිය ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයේ මැනුම් ක්ෂෙත්‍ර සහයකයින් ක්ෂෙත්‍ර රාජකාරිවල යෙදෙන දින ගණන සියයට 40 කටත් වඩා අඩු මට්ටමක පවතින බවත් ඇතැම් මාසවල එකදු ක්ෂෙත්‍ර රාජකාරියක හෝ නිරතව නොමැති බවත් නිරීක්ෂණය විය.තවද එක් එක් මැනුම් ක්ෂේත්‍ර සහායක නිලධාරියා මාසයක් තුළ ක්ෂෙත්‍ර රාජකාරි සඳහා නිරත වීම් පිළිබඳ ජනවාරි, පෙබරවාරි, මැයි, ජුනි මාස සඳහා සිදුකළ නියැදි පරීක්ෂාවේදී ඇතැම් නිලධාරීන් දින 01 ත් 17 ත් අතර ප්‍රමාණයක රාජකාරීවල නිරතව තිබුණි. ඒ අනුව මැනුම් ක්ෂෙත්‍ර සහායක තනතුරේ සේවකයින් වැඩි වශයෙන් ඌන සේවා නියුක්තව සිටින බව නිරීක්ෂණය විය.	2024 වසරේ පැවති වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය අදාළව ක්ෂේත්‍ර කටයුතු සඳහා රජයේ මිනින්දොරුවරුන්ගේ දායකත්වය සමස්තයක් ලෙස අඩු වූ බැවින් බැවින් මැනුම් ක්ෂේත්‍ර සහායකයින් ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වූ දින ගණන අඩුවී ඇත.	මැනුම් ක්ෂේත්‍ර සහයකයින් උපරිම ලෙස සේවයේ යොදා ගතයුතුය.
(ඉ)	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය මැනුම් විද්‍යාව පිළිබඳ උපාධිය හැදෑරීමට සඳහා 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂ 08 ක කාලයට උපාධි පාඨමාලා 02 ක් පවත්වා උපාධිධාරීන් 104 ක් බිහිකර ඇති අතර 2022 සිට 2026 දක්වා වර්ෂ 4 ක පාඨමාලාව සඳහා සිසුන් 22 ක් වැනි ඉතා අඩු සංඛ්‍යාවක් අධ්‍යයන කටයුතු වල නිරතව සිටිති. ඒ අනුව මෙම ආයතනයේ සම්පත් ඌන උපයෝජිත තත්වයක පවතී.	1969 අංක 21 දරණ මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය ස්ථාපනය කිරීමේ පනත සංශෝධනය සඳහා නව කැබිනට් මණ්ඩලයේ එකඟතාවය ලබා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී. තවද මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය සඳහා නව ගිණුමක් විවෘත කිරීමට කටයුතු සිදු කරගෙන යමින් පවතී. ඉහත අවශ්‍යතා සම්පූර්ණ වීමෙන් පසු බාහිර අපේක්ෂකයන් සඳහා ද මෙම ආයතනයෙන් සේවාවන් ලබා දීමට හැකියාව ලැබෙනු ඇත. උපාධි පාඨමාලාවට හා කෙටිකාලීන පාඨමාලාවට අමතරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවට බඳවා ගනු ලබන මැනුම් විද්‍යා උපාධිධාරීන් සඳහා වන මාස 06ක යොමුගත කිරීමේ පාඨමාලාව , ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සිතියම් තාක්ෂණ නිලධාරීන් සඳහා වන අවුරුදු 02ක ඩිප්ලෝමා පාඨමාලාව සහ නවක මැනුම් විද්‍යා උපාධිධාරීන් සඳහා වන මාස 03 ක යොමු ගත කිරීමේ පාඨමාලාව ද පවත්වනු ලබයි. එබැවින් දැනට මෙම ආයතනයේ සම්පත් ඌණ උපයෝජනයෙන් තොරව භාවිතාවේ.	සිසුන්ගේ ධාරිතාවය වැඩිකර සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගතයුතුය.

(ඊ)	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ 2022-2026 උපාධි කණ්ඩායමේ සංයුතිය වෙනත් උපාධිධාරීන් 08 ක් හා තාක්ෂණ නිලධාරීන් 14 ක ගෙන් යුක්ත වූ අතර මෙම පාඨමාලාවට තෝරා ගැනීමේ දී අනෙකුත් උපාධිධාරීන් ප්‍රමාණය තීරණය කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් තිබූ අතර තාක්ෂණ නිලධාරීන් තරඟ විභාගයකින් තෝරා ගන්නා බව 2021 ජූලි 02 දිනැති අංක 16/2021 දරන මිනින්දෝරු දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩල චක්‍රලේඛයෙහි සඳහන් වුවද එසේ බඳවා ගනු ලබන ප්‍රමාණය තීරණය කිරීම සඳහා වන නිශ්චිත ක්‍රමවේදයක් හෝ ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.	ඉහත පිලිතුර අදාල වේ.	තාක්ෂණ නිලධාරීන්ගේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය.
(උ)	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය 2022 සිට 2026 දක්වා වූ සිව් අවුරුදු උපාධි පාඨමාලාව යටතේ සිසුන් 22ක් වෙනුවෙන් අධ්‍යන කටයුතු කරගෙන යන අතර කෙටි කාලීන පාඨමාලා 14 ක් හා එක්දින වැඩමුළු 38 ක් පමණක් 2024 වර්ෂයේ පවත්වා තිබුණි. මෙම ආයතනය විවිධ ගොඩනැගිලි අංග 121 කින් සමන්විත අක්කර 61 ක භූමිභාගයක් තුළ ඉතා විශාල භෞතික සම්පත් සහිතව පිහිටා ඇතත් ඒවායේ උපයෝජනය ඉතා අඩු මට්ටමක පැවතිණි.	ඉහත පිලිතුර අදාල වේ.	සම්පත් උපරිම ඵලදායීතාවයෙන් භාවිතයට ගත යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	(see table below)	දෙපාර්තමේන්තුවේ 2020 වර්ෂයේ සිටම රජයේ ප්‍රතිපත්ති තීරණයක් මත බඳවා ගැනීම් නතර කර තිබූ බැවින් සියළුම ශ්‍රේණිවල තනතුරු පුරප්පාඩු ඇති වී ඇත. මෙම බඳවා ගත හැකි පුරප්පාඩු තනතුරු සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගැනිමට අනුමැතිය ලබා දෙන ලෙස කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට හා අග්‍රමාත්‍ය කාර්යාලයේ බඳවා ගැනිමේ කමිටුවට මේ වන විටත් දැනුම් දී ඇත. කාර්ය මණ්ඩල සමාලෝචනය කිරිම පිළිබඳ සම්පූර්ණ සවිස්තර වාර්තාවක් ද මේ සමඟ යොමු කර ඇත.	පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේදි කාර්ය මණ්ඩලය සංශෝධනය කර වාර්ෂික මැනුම් ඉලක්කයන්ද සංශෝධනය කළ යුතුවේ.

සේවා වර්ගය	අනුමත	තත්‍ය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	1144	834	310
තෘතීයික	82	26	56
ද්විතීක	1372	1044	328
ප්‍රාථමික	4890	3076	1814
අනියම්	0	0	0
තාවකාලික (බහුකාර්ය)	0	0	0
කොන්ත්‍රාත්	0	0	0
එකතුව	**7,488**	**4,980**	**2,508**

අනුමත කාර්යය මණ්ඩලයට සාපේක්ෂව ජ්‍යෙෂ්ඨ මට්ටමේ සියයට 27 ක්, තෘතීයික මට්ටමේ සියයට 68

අනුමත සමස්ථ කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 33 ක තනතුරු පුරප්පාඩු තිබුණද තථ්‍ය කාර්ය මණ්ඩල තනතුරු සංඛ්‍යාව පදනම් කර ගනිමින්

ක්, ද්විතීයික මට්ටමේ සියයට 24 ක් හා ප්‍රාථමික මට්ටමේ සියයට 37ක් වශයෙන් සමස්ත කාර්යය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 2,508 ක් විය. එසේ සමස්ත කාර්යය මණ්ඩල පුරප්පාඩු සියයට 33 ක් පැවතියද කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව අනුව වාර්ෂික මැනුම් ඉලක්කය සියයට 114 ප්‍රගතියක් ලබාගෙන ඇති බැවින් වාර්ෂික මැනුම් ඉලක්කයන් හා පුරප්පාඩු නැවත සංශෝධනය කළ යුතු බව විගණනයේදි නිරීක්ෂණය විය.

වාර්ෂික මැනුම් ඉලක්ක සකස් කර කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කර ඇති බැවින් හා තථ්‍ය කාර්ය මණ්ඩලයේ කැපවීමෙන් අපේක්ෂිත වාර්ෂික මැනුම් ඉලක්ක අභිබවා සියයට 114 ක ප්‍රගතියක් වාර්තා කර ඇති බව නිරීක්ෂණය කරමි.මෙසේ ලබාදුන් ඉලක්ක මත ලබාගත් ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස දැක්වීම සිදු කරනු ලබන්නේ මිනින්දෝරු සේවයේ හා ක්ෂේත්‍රගත රාජකාරි ඉටු කරන නිලධාරීන් සඳහා පමණි.